# ශ්‍රී ලංකාවේ පරිසර පරිපාලන නීතිය

සී. විජයවික්‍රම ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව,

1976 ජුනි 5 ද ලෝක පරිසර දිනය විය. එක්සත් ජාතීන්ගේ මහා සමුළුව 1972 වර්ෂයේ දී පැවැත් වූ එහි 27 වෙනි සැසිවාරයේ දී එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහන පිහිටුවන ලදී. මෙම වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ජාතික ගස සිටුවීමේ දීප ව්‍යාප්ත ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පරිසර සංරක්ෂණයේ අවශ්‍යතාව මැනවින් වැටහීගොස් ඇති මෙවැනි අවස්ථාවක පරිසර පාලන හා පරිපාලන නීතියේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ විමසා බැලීම හිතකර ය. දිවයිනේ වත්මන් සමාජ හා ආර්ථික රටාව පරිණාමය වීමේ දී පරිසරය හා අදාල නීතිමය විධිවිධාන ඒ හා සම්බන්ධ වූ ආකාරය කෙටියෙන් විග්‍රහ කිරීමට මෙහි දී තැත් කරනු ලැබේ.

මිනිසා පරිසරයේ කොටසක් ලෙස හෝ නැතහොත් පරිසරය හැඩගස්වන්නකු ලෙස සැලකේ. ස්වභාවික පරිසරය නිරන්තරයෙන් වෙනස්වන සුලු ස්වභාවයක් ගනී. මිනිසාගේ මැදිහත්වීමෙන් සිදුවනුයේ මෙම වෙනස්වීමේ පරිමාණය හා වේගය තීව්‍රවීම මෙන් ම ඇතැම් අවස්ථාවලදී වෙනස්වීම් නැවත යථා තත්වයට ආපසු ගෙන ආ නොහැකි තත්වයකට පත්වීමත්ය. යම් මිනිස් සමාජ සංවිධානයක 'පරිසරය' කුමක්දයන්න එම සමාජයේ සංස්කෘතික දියුණුව හා අනුකූලවන සාපේක්ෂ අර්ථයකින් යුක්ත වන බව පෙනේ. ඓතිහාසික වශයෙන් සලකන විට ලෝකයේ නොයෙක් සමාජ අතර හුදකලා මෙන්ම සීමිත පරිසර පැවතුනද, විද්‍යාව හා තාක්ෂණික ඥානය ඉදිරියේ ක්‍රමයෙන් හැකිලී ගිය ලොවක පරිසරය යන්නට ඇත අභ්‍යාවකාශයද ඇතුලත් විය හැකිසේය. සංස්කෘතික හා භෞතික හෙවත් ස්වභාවික පරිසරය යනුවෙන් කරනු ලබන ගතානුගතික පරිසර බෙදුම යම් වැදගත්කමකින් යුක්ත වෙන සේ පෙනෙනුයේ සංස්කෘතික දියුණුවෙන් (විද්‍යා තාක්ෂණික) ඉහළ යත්ම භෞතික පරිසරය කෙරෙහි වන බලපෑම හෝ හානිය ද ක්‍රමයෙන් වැඩි වන බව පෙනී යන හෙයිනි. මිනිසා අති විශාල බලයක් ලබා ගන්නා ගමන්ම අති විශාල වගකීමක්ද ඉසිලිය යුතු අයෙකු වී ඇත.

ස්වභාවික පරිසරය එයටම ආවේණික වූ සමතුලිතතාවයකින් හා චක්‍රීය ස්වභාවයකින් යුක්ත වන බවත් එම පරිසරයෙන්ම පරිණාමය වූ මිනිසාගේ මැදිහත්වීමෙන් මෙම සමබරතාවය නැතිව යන බවත් පැවසේ. පෘථිවියේ සම්භවය හා ස්වභාව ධර්මයේ කාල සටහන හා සසඳන විට මිනිසාගේ පරිණාමයේ ආරම්භය හා මිනිස් ශිෂ්ටාචාරයේ ආරම්භයත් විශේෂයෙන්ම කාර්මික විප්ලවයේ ආරම්භයත් දැනට ස්වල්ප වේලාවකට පෙර ඇති වූවක් වැනි වේ. මෙසේ මිනිසාගේ ක්ෂණික හානි මගින් සිදුවන අසමබරතාවය නැවත සමතුලිතතාවයට ගෙන ඒමේ මගක් කලකට පෙර මෝල්තස් දක්වන ලද නමුත් එය පරිසරය යථා තත්වයට ගෙන ඒමක් නොව හානි කළ අය නැතිකර දැමීමක් විය. සීමිත සම්පත් ඉදිරියේ ජන සංඛ්‍යා ප්‍රසාරණයක් වැලැක්වීමේ අවශ්‍යතාවය පෙන්වා දුන් ලේඛකයින් හැරුන විට මෑතක් වන තුරුම (හැබිටැට් සමුළු) පරිසරය සංරක්ෂණය කිරීමේ වැදගත්කම පෙරමුණට පැමිණියේ නැත.

අතීතයේ දී විදේශිකයන් විසින් උයන්වතු වලින් යුත් රමණීය දිවයිනක් ලෙස කීපවරකම හඳුන්වා දී ඇති ශ්‍රී ලංකාවේ දාගැබ හා වැව් මත පදනම් වූ සමාජ ආර්ථික ක්‍රමයෙකින් පරිසර පාලනයේ මුල් බීජ හමුවේ නම් එය පුදුමයට කරුණක් නොවේ. ඉන්දියාවේ හටගත් නොයෙක් දර්ශන වාද අතුරින් ජෛන ආගම මෙන් අන්තවාදීව නොව තමන්ට සෙවන දෙන ගස් වැල් කෙරෙහි අවා කළගුණ සැලකීමේ හිතකරභාවය බෞද්ධ දර්ශනයෙන් පිළිගැනින. සිංහල රජ දරුවන්ගේ ඇතැම් ශිලා ලිපි අනුව ඇතැම් සතුන්ට හානි කිරීම දඬුවම් ලැබිය යුතු අපරාධයක් විය. මෑතක දීවුවද පරිසරය රැකගැනීමේ උත්සාහවල දී මෙම සංස්කෘතික වටිනාකම් උපයෝගී කර ගත හැකිවනු නොඅනුමානය. ලෝකයේ ඉතා දියුණු රටවල මෙන් මනාව සංගෘහිත පරිසර ආරක්ෂණ නීති පද්ධතියක් හෝ පරිසර පරිපාලන අධිකාරියක් හෝ නැතත් දිවයිනේ ව්‍යවස්ථා සංග්‍රහයේ පරිසර පාලනය හා සංරක්ෂණය හා කෙලින්ම මෙන්ම වක්‍රව සම්බන්ධ නීති විධිවිධානවල හිඟයක්

නොමැත. එහෙත් පරිසරය පරිපාලනය කිරීමෙහිලා අවශ්‍යතාවයක් නොදුනුනු හෙයින්දෝ මෙම නීතිවලට ඊට අවශ්‍ය සදචාරාත්මක අනුබලය නොතිබුණ සේය. බොහෝ පණත් හා විධිවිධාන හුදෙක් අකුරුවලට ම සීමා වූ මළ පණත් වැනි විය. වඩා වැදගත් සේ සැලකූ වෙනත් විවිධ සමීප ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට යාමේදී මතු වූ කරුණක් වශයෙන් මිස පරිසරය කෙරෙහි මිනිසාගේ මැදිහත්වීම ක්‍රමවත් හා පරිපාලනය කිරීමේ අරමුනකින් බොහෝවිට මෙම විධිවිධාන නොපැනවිනි. මේ හේතුවෙන් ක්‍රියාත්මක හා ප්‍රයෝගික අංශයෙන් මේවායේ සාර්ථකත්වය හා කාර්යක්ෂමතාවය අගය කිරීමේ හෝ විග්‍රහ කිරීමේ අවශ්‍යතාවයක් හෝ ආයතනයක් හෝ නොවිනි.

රටේ භූ භෞතික පදනම අනුව ඛණිජ සම්පත් හිඟවීමත් විවිධ දේශගුණික පරිසර දක්නට ලැබීමත් නිසා භූමිය වැදගත්ම සම්පත සේ සලකුණි. දිවයිනේ දක්නට ලැබෙන කෘෂිකාර්මික ආර්ථිකයේ ද්විත්වය ( **Dualism** ) එනම් ඉතා දියුණු වතුවගා ක්‍රමයක් හා නොදියුණු පරිභෝගික ගැමි ගෙවතු වගාව ද අනුව සලකා බලන විට 1920 ගණන්වල සිටම තේ, රබර් හා පොල් වගාව හා සම්බන්ධ පණත් රාශියක්ම දක්නට ලැබුණි. මෙම නොයෙක් පණත්වල විධිවිධාන හා රෙගුලාසි මඟින් ඉතා දියුණු විද්‍යාත්මක වගා ක්‍රමයක් බිහි කිරීමට හැකි විය. භූ විෂමතා ලක්ෂණ අනුව විශේෂයෙන් තේ හා රබර් වගා සම්බන්ධයෙන් පාංශු ඛාදනය වැලැක්වීමේ පියවරවල් අත්‍යවශ්‍ය වූ අතර පාරිභෝගික ගෙවතු සම්බන්ධයෙන් මෙවැනි ව්‍යවස්ථා පිත විධිවිධ නයන් පැනවුනේ 1972 වර්ෂයේ කෘෂිකාර්මික ඵලද වර්ධන පණත මඟිනි. මෙම කෙටස් දෙක අතරතුර ට වැටෙන කුඩා ඉඩම් හිමියන් 1950 ගණන්වල පැනවූ කුඩා ඉඩම් නැවත වගාකිරීමේ සහනාධාර පණත්වල විධිවිධාන වලින් ආවරණය කරනු ලැබීය. 1970 න් පසු අවධිය පරිසර සංරක්ෂණය කිරීමේ අභිලාෂයක් පෙන්වූ තේ, රබර් හා පොල් වගා සම්බන්ධ පණත් රාශියකින් යුක්ත විය. 1975 දී තේ මණ්ඩල, පොල් සංවර්ධන, කුඩා තේ ඉඩම් සංවර්ධන නීති පනවීම නිදසුන්ය.

පරිසරය රැකීම හා බැඳුණු නොයෙක් නීතිරීති තිබුණත් ඒ පිළිබඳව ජාතික වශයෙන් අවධානයක් යොමු නොවූ බවට කදිම නිදසුනක් වනුයේ රටේ ආර්ථික සංවර්ධන සැලසුම්වලදී ඒ පිළිබඳව සඳහනක්වත් නොදීම ය. මෑත පස් අවුරුදු සැලැස්මේ දී (1972 – 76) වුව ද මෙහිලා වැදගත් අවධානයක දී ඇති බවක් නොපෙනේ. ව්‍යවස්ථාදායකය මඟින් ගත වූ කාලය තුළදී පැනවූ නොයෙක් පණත් මඟින් පිළිගෙන ඇති ප්‍රතිපත්තිය සේ පෙනෙනුයේ පෞද්ගලික දේපල අයිතිය හා පෞද්ගලික ව්‍යවසාය මත පදනම් වූ සම්පත් උපුටා ගැනීමට ඉඩ සලසා දීම බව පෙනේ. මූලික වශයෙන් වගාව සඳහා භූමියෙ ද ගැනීම හැරුන විට ඛනිජ වස්තු (ඉල්ලම් ආකර හා ඛණිජ වස්තු පණත 1947) ධීවර හා ආශ්‍රිත (හක් බෙල්ලන් පිළිබඳ ආඥාපණත හා පණත 1890/1953, මුතුපර 1925, තල්මසුන් 1936, ධීවර ආඥා පණත 1940) වනාන්තර (වනාන්තර ආඥාපණත 1907, පැලෑටි සංරක්ෂණ ආඥාපණත 1924, ගස් කැපීම (පාලනය) පිළිබඳ පණත 1951) යනාදිය හා සම්බන්ධ ව්‍යවස්ථා මෙහිලා නිදසුන් වශයෙන් සඳහන් කළ හැකිවේ. මෙවැනි අවධියක දී ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයන් විසින් පරිසරය පිළිබඳව දක්වන ලද උනන්දුව අගය කළ යුතුවේ. මුලදී (1894) විනෝදය සඳහා සතුන් රැකීමේ අරමුණින් ඇරඹුණු සංවිධානයක් පසුව (1930) ක්‍රීඩා හා සත්ව ආරක්ෂණ, (1957) වන සත්ව ආරක්ෂණ හා (1969) වන සත්ව හා ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීමේ සමිතිය වශයෙන් පරිණාමය විය. සත්වයින් හා වෘක්ෂ ආරක්ෂා කරගැනීමෙහි ලා නොයෙක් ව්‍යවස්ථා විධිවිධාන මෙන්ම පරිසර සංරක්ෂණය පිළිබඳ සෙසු පණත් කෙරෙහි ද මෙම සමිතියෙන් ඉටුවූයේ අතිමහත් සේවාවකි.

මූලික වශයෙන් මුඩුබිම් පණත් (1841, 1897) මඟින් ලබාගත් ඉඩම්වල කෝපි හා පසුව තේ වගාව ඇරඹීමත් සමඟ ගෙනෙනු ලැබූ ඉන්දීය කම්කරුවන්ගේ සුභ සාධනය සඳහා පැනවූ විවිධ පණත්වල ඔවුන්ගේ සෞඛ්‍යය, සනීපාරක්ෂාව හා සම්බන්ධවෙමින් නොයෙකුත් පරිසර පාලන නීති පැනවිනි. මේවා එක් අතකින් බලන විට වතුකරයේ නගර හා ග්‍රාම සැලසුම් විධිවිධානසේ හැඳින්විය හැකිය. මෙවැනි විධිවිධාන (බොහෝ විට ඉන්දීය රජයේ බලපෑම මත) වතු කම්කරු (ඉන්දියානු) 1889 හා ඉන්දීය සංක්‍රමණ කම්කරු 1923 යන ආඥාපණත්වල දක්නට ලැබේ.

දිවයිනේ අපරාධ නීතියේ අංග වශයෙන් පරිසර පාලනය පිළිබඳ විධිවිධාන රැසක් දක්නට ලැබේ. අපරාධ නීතිය පිළිබඳ මූලික ව්‍යවස්ථාව වන දණ්ඩ නීති සංග්‍රහයේ (1883) 14 වන පරිච්ඡේදයේ මහජන සෞඛ්‍යය, ආරක්ෂාව, පහසුව සභ්‍යත්වය හා සදචාරය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් එහි 261 – 289 දක්වා වගන්ති අතර පොදු උල්පත් හෝ ජලාශ අපවිත්‍ර කිරීම හා කිලුටු කිරීම, වතාවරණය දූෂිත කිරීම, මහජනයාට කරදර වන වැරදි නිදසුන් වශයෙන් දැක්විය හැකිය.
දණ්ඩ නීති සංග්‍රහයේ 408 වගන්තියෙන් දැක්වෙන අනර්ථය නම් වරද යටතේ සතුන් මැරීම හෝ අංග විකල කිරීම, ගහකට පාඩු කිරීම යනාදි වැරදි දක්වා ඇත. මීට පෙර 1862 දී පැන වූ පොදු පීඩා පිළිබඳ ආඥාපණතේ අරමුණ වූයේ පොදු සෞඛ්‍ය රැකගැනීමත් කරදර පීඩාවන් යටපත් කරගැනීමත් විය. ගෙවල් අපවිත්‍ර ලෙස තබාගැනීම, ජලය අපවිත්‍ර ලෙස රඳවා තැබීම, දියපාරවල් හා ජලාශවලට අපවිත්‍ර දෑ දැමීම, පාරවල් අපවිත්‍ර කිරීම යනාදි වැරදි මෙම පණතේ විශේෂයෙන්ම සඳහන් කර ඇත. පාරවල් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන 1861 පොදු පාරවල් පිළිබඳ ආඥාපණතේ ද ඇතුලත්ව ඇත. මෝටර් ප්‍රවාහන පණතේද මෙවැනි පරිසරය අපවිත්‍ර කිරීමට අදාල පොදු වැරදි දක්වා ඇත. කලින් අපරාධ විධිවිධානසංග්‍රහයේ (1898) සමාජ යහපතට හානිවන කටයුතු (105, 106, 114 වගන්ති) වැලැක්වීමට මහේස්ත්‍රාත්වරුන්ට බලය දී තිබුනු අතර යුක්තිය පසිඳලීමේ නීතියේ (1973) 60 වන වගන්තිය මඟින් පරිසරය කෙරෙහි බලපාන පොදු හානිකර පීඩා වැලැක්වීමට විශේෂ බලතල මහේස්ත්‍රාත්වරුන්ට දී ඇත.

විශේෂයෙන් දෙවන ලෝක යුද්ධ කාලයේ දී 1940 ගණන්වල ඇතැම් කාර්මික භාණ්ඩවල හිඟයක් ඇතිවීමත් සමඟ දිවයිනේ කර්මාන්ත අංශයක ආරම්භය හට ගැනිණ. 1942 කම්හල් ආඥාපණතෙන් කම්කරුවන්ගේ ආරක්ෂාව හා සුබසාධනය පිළිබඳ පැනවූ විධිවිධාන අතර වායුව අපිරිසිදු වීම, විෂ ද්‍රව්‍ය නිකුත්වීම යන කරුණු පිළිබඳව ද අවධානය යොමු වූනි. කෙසේ වෙතත් පරිසරය කෙරෙහි බෙහෙවින් බලපෑ, මහා පරිමාණ කර්මාන්ත රැසක් බිහිවූනේ වඩා පසු අවධියක 'රාජ්‍ය සංස්ථා' වශයෙනි. සිමෙන්ති කඩදසි, තුනීලෑලි, රසායන ද්‍රව්‍ය, හම් යන දිවයිනේ ආරම්භක කම්හල් පිහිටුවීමේ දී ඒවායින් පසුකලෙක වන පරිසර බලපෑම කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි. පසු කලෙක ඉතා සීඝ්‍රයෙන් මතු වූ නොයෙක් කාර්මික සංස්ථා ද්‍රව්‍යමය දියුණුවක් ඉදිරියේ ස්වභාවික පරිසරයට අපමණ හානි කර ඇත. දිවයිනේ සමස්ත යහපත සලකන විට මෙම යෝධ කම්හල් 'කුඩා දෙය අලංකාරය' යන කෘතියේ ෂූමාකර් විසින් පෙන්වාදී ඇති ඇතැම් කරුණු සිහියට නංවයි. අඩුතරමින් මේවායින් කුමන තරාතිරමේ හානියක් වේද යන්න පිළිබඳවවත් ඉතා මෑතක් වනතුරු කිසිවකුගේ අවධානයවත් යොමු වූයේ නැත.

කාර්මිකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් පැන වූ සුභ සාධක නීති මඟින් වක්‍රව සැලසුනු ඇතැම් ස්වල්ප විධිවිධාන මෙන් නොව නාගරීකරණය පරිසර පාලන පණත් රැසක් බිහි කළේ ය. ගම්සභා, නගර සභා, සුළු නගර සභා, මහ නගර සභා පණත්

මඟින් පලාත් පාලනආයතනවලට දෙන ලද බලතල හා යුතුකම් අතර පරිසර පාලන කටයුතු ද ඇතුලත් විය. නිවාස හා නගර වැඩි දියුණු කිරීමේ ආඥාපණත (1915) හා විශේෂයෙන් 1946 නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපණත සංස්කෘතික පරිසරය රක්ෂණය පිළිබඳ ප්‍රථම සවිස්තර පියවරක් වැනිය. සංස්කෘතික පරිසරය පාලනය කිරීමේ ලා පැනවූ නොයෙකුත් පණත් අතර ලිං හා වලවල් පිළිබඳ ආඥාපණත (1884) . උතුරු පලාතේ වෙළඳ පොළවල් පිළිබඳ ආඥාපණත (1891), මස් මරණ ස්ථාන පිළිබඳ පණත (1893), මහ නගර (1896) හා උප නගර (1908) කිරි පට්ටි හා රෙදි සෝදන තැන් පිළිබඳ පණත් කොළඹ ජල කර්මාන්ත (1907) මඩකලපුව ජල කර්මාන්ත පණත (1925) හා විශේෂ ප්‍රදේශ (කොළඹ) සංවර්ධන පණත (1947) සඳහන් කළ හැකිවේ.

බොහෝ විට නාගරික ප්‍රදේශ කෙරෙහි බලපෑමේ අදහසින් පණවන ලද පොදු සෞඛ්‍යය, සනීපාරක්ෂාව හා ආරක්ෂාව සඳහා ඉනාවුනු පණත් රැසක පරිසර පාලනය කෙරෙහි බලපාන විධිවිධාන ඇතුළත් විය. බෝවන රෝග (1866), වන්දනා ගමන් (1896), නිරෝධායන හා බෝවන රෝග වැලැක්වීමේ ආඥාපණත (1897), අන්තරාදායක සතුන් (1921), මත් ගංජා හා භයානක බෙහෙත් ද්‍රව්‍ය (1929) යන ආඥාපණත් නිදසුන් ලෙස දැක්විය හැකිය. ඓතිහාසික පරිසරය රැක ගැනීමේලා ගත් උත්සාහ ලෙස නිදන් වස්තු (1887), කැසි ආරක්ෂා කිරීමේ (1917), හා පුරා වස්තු (1940) පණත් වැදගත් වේ.

ගස්වැල් හා සතුන් පිළිබඳ පණත් රාශියක්ම දක්නට ලැබීම විශේෂ ලක්ෂණයකි. වනාන්තර (1907) සතුන්ට හානි කිරීමේ පණත (1907), දිය පාසි (1909), සත්ව ලෙඩ රෝග (1909), අලින් ඇල්ලීම (1912), පැලෑටි රක්ෂණ (1924), උද්භිද උද්‍යාන (1928), සත්ව හා වෘක්ෂ ආරක්ෂණ (1937), ඉඩම්වල බලෙන් පදිංචිවීම (වැලැක්වීම) (1940), කිරීට ඉඩම් (1947), ගස්කැපීම (පාලනය කිරීම) (1951), සත්ව පණත (1958) යනුවෙන් පණත් රාශියකි. ගංවතුර වැලැක්වීමේ (1924) හා පස සංරක්ෂණය කිරීමේ (1951) පණත්ද මෙයටම ඇතුළත් කළහැකිවේ.

රටක තෘතීය ආර්ථික කටයුත්තක් ලෙස සැලකෙන දේශ සංචාරක ව්‍යාපාරය කෙරෙහි 1960 ගණන්වල සිට යොමු වූ ජාතික අවධානයේ ප්‍රතිඵලයක් වශයෙන් බෙහෙවින් ''බලවත්'' සංචාරක වර්ධන පණත (1967) බිහි විය. ස්වභාවික පරිසරයට වඩා මෙහි දී වැඩි සැලකිල්ලක් යොමු වනුයේ සංස්කෘතික පරිසරයට වුවත් පරිසර පරිපාලනය කෙරෙහි උනන්දුවක් ඇති කරවීමේ ලා දේශ සංචාරක කර්මාන්තය බෙහෙවින් උපයෝගී විය. 1970 සිට සත්ව රක්ෂණ දෙපාර්තමේන්තුව නාවුක හා සංචාරක අමාත්‍යාංශය යටතට ගැනීම නිදසුනක් ලෙස දැක්විය හැකිය. රටේ පවතින චිරානුගත පරිපාලන ආයතන අභිබවා යන බලතල සහිත ආයතනයක් ඇති කරන මෙම පණත පරිසර පරිපාලන මණ්ඩලයක් අනාගතයේ දී ඇතිවුවහොත් ඊට දිය යුතු කුමන බලතල ද යන්න සිතා ගැනීමට උපකාරී වේ.

පරිසර පාලනය හා සංරක්ෂණය සම්බන්ධ නොයෙක් විධිවිධාන යෙදවීම මූලික වශයෙන් රජයේ දෙපාර්තමේන්තු මාර්ගයෙන් කරනු ලැබිය යුතු විය. මීට වෙනස් වූයේ පලාත් පාලන ආයතනවල ඇතැම් අතුරු නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පමණි. එහෙත් සංස්ථා සංකල්පය පැතිර යාමත් සමඟ පරිසර පාලන විෂයයන් කෙරෙහි ද සංස්ථා පිහිටුවීම ඇරඹිනා. ජල සම්පත් මණ්ඩලය (1964), කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය (1968), ජලාපවාහන හා ජල සම්පාදන මණ්ඩලය (1974) මෙසේ ඇති කළ සංස්ථා විය. මෙම සංස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සලකා බලන විට පරිසර සංරක්ෂණයේ ලා විවිධ විෂයයන් විෂය මූලිකව එක්කොට සලකා බැලීමේ ඇති අවශ්‍යතාව එළිදරව් වේ. තවත් අතකින් බලන විට ගල්ඔය සංවර්ධන මණ්ඩලය (1949) පසුව ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය (1965) හා මහවැලි සංවර්ධන මණ්ඩලය (1970) භූගෝලීය පරිසර මූලිකව ගෙන සලකා බැලීමේ ලා ගත් උත්සාහයක් වැනිවේ.

ශ්‍රී ලංකා ජනරජය බිහිවීමත් සමඟ පරිසර පාලනය හා සම්බන්ධ නීති අංශයේ නව නැම්මක් හටගෙන ඇතිසේ පෙනේ. මීට හේතුව සමහරවිට ජනරජ ව්‍යවස්ථාවේ දැක්වෙන රාජ්‍ය ප්‍රතිපත්ති මූල ධර්ම විශේෂයෙන් සමාජ ඵලය සමාන ලෙස බෙද හැරීම, සාමූහික දේපල ක්‍රමය දියුණු කිරීම යන අංග හැරෙන විට ක්‍රමයෙන් වැඩිවන ආර්ථික දුෂ්කරතා ඉදිරියේ සම්පත් මනාලෙස භාවිතා කිරීමේ හා රැක ගැනීමේ අවශ්‍යතාව දැනීයාමද විය හැකිය. මූලික මිනිස් නිදහස් හා අයිතිවාසිකම් යටතේ පුද්ගලික දේපල අයිතිය හඳුනා ගෙන නොතිබීමත්, පොදු යහපත ඉදිරියේ, දී ඇති මූලික අයිතිවාසිකම් යටපත්වීමත් පසුව පැන වූ ජනරජ ව්‍යවස්ථා විධිවිධානවල අරමුණු වටහා ගැනීමේ දී වැදගත්වේ. කලින් පැවති නොයෙක් පණත් එක් කොට සමස්ත තනි පණතක් පැනවීම හෝ විවිධ පණත් යටතේ එන අධිකාරී කෙරෙහි බලපාන තනි අධිකාරියක් පිහිටුවීම හෝ යල් පැන ගියාසේ පෙනෙන පණත් වෙනුවට අංග සම්පූර්ණ නව පනතක් හෝ නව අදහස් හා අවශ්‍යතාවයනට අනුව අනුරූප වනසේ පොදු ආයතන අළුතින් ස්ථාපනය කිරීම යනාදි වශයෙන් මෙසේ පසුගිය අවුරුදු තුන හතරක කාලය තුළ දී නීති රැසක්ම බිහිවිය. ගවයින් නිදැල්ලේ හැසිරීම (1876) ගවයින් හංඩු ගැසීම, විකිණීම හා හුවමාරු කිරීම (1898) හා මී හරකුන් ආරක්ෂා කිරීම (1920) යන පණත් වෙනුවට එක්කොට පැනවූ සත්ව පණත (1958) පමණක් මීට ව්‍යාතිරේකයක් වශයෙන් සැලකිය හැකිවේ.

කෘෂිකාර්මික ඵලදවර්ධන නීතිය (1972), පතල් හා ඛණිජ ද්‍රව්‍ය පණත (1973), තට්ටු නිවාස හිමිකම් හා පොදු පහසුකම් මණ්ඩල පණත් (1973), ශ්‍රී ලංකා තේ මණ්ඩල පණත (1975), පොල් සංවර්ධන නීතිය (1975), කුඩාතේ ඉඩම් සංවර්ධන නීතිය (1975), සාමුද්‍රික කලාප පිළිබඳ නීතිය (1976), ඉඩම් ප්‍රවර්ධන ගාස්තු නීතිය (1976) මෙසේ පැන වූ නීති අතර වේ. විද්‍යාත්මක ශිල්ප ක්‍රම, සංරක්ෂණ හා ක්‍රමවත් භාවිතය යනාදි අංග කෙරෙහි අවධානය යොමු කිරීම නිසා දැනට ලොව හටගෙන ඇති පරිසර ආරක්ෂණයේ අවශ්‍යතාවයේ බලපෑම පැහැදිලිවම දැනී ඇති බව මෙම නීති දෙස බැලීමේ දී පෙනේ. වෙරළ සංරක්ෂණය පිළිබඳ කෙටුම්පත් නීතියක් දැනට ඉදිරිපත් වී ඇති අතර මෙය අනාගතය දෙසට තබන ලද තවත් ඉදිරි පියවරක් ලෙස සැලකිය හැකි වනු නොඅනුමානය. කෙසේ වෙතත් බොහෝ වූ නීති තිබුණත් ඒවායින් අදහස් කළ කාර්ය ඉටු කරගැනීම සම්බන්ධයෙන් ඇති ආයතනික සංවිධානය සම්බන්ධයෙන් තවමත් එතරම් සැලකිල්ලක් යොමුව නැති බව පෙනේ. පරිසරය පිළිබඳ වෙනම දෙපාර්තමේන්තුවක් හෝ මණ්ඩලයක අවශ්‍යතාව මෙහි දී වැදගත් ය. පරිසරය පිළිබඳ දෙපාර්තමේන්තුවක් බ්‍රිතාන්‍යයේ පිහිටුවූයේ ද 1970 වර්ෂයේ දී බව සිතන විට මෙවැනි පරිසර ආයතනයක් පිහිටුවීමේ ලා අප එතරම්ම ප්‍රමාද වී ඇතැයි කිව නොහැකි ය.